නවක වදය නැවැත්වීමට ඇති ලොකු ම බාධකය තමයි මෙයින් අපහසුතාවයට ලක්වන ශිෂ්‍ය ශිෂ්‍යාවන් අපට මේ පිළිබඳව පැමිණිලි නොකිරීම. සමහර විට එයින් ඔවුන්ට ජ්‍යේෂ්ඨ ශිෂ්‍යන්ගෙන් කරදර ඇති වෙයි කියන හැඟීමක් ඇති කියලා මම විශ්වාස කරනවා. මේකෙන් සිද්ධ වෙන්නේ අපේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ පෞරුෂය දුර්වලවීම. නමුත් මම කියන්න සතුටුයි විද්‍යාපීඨය තුළ එවැනි බරපතළ සිද්ධීන් වාර්තා වෙලා නැහැ. අනෙක හැම අවුරුද්දකම නවක ශිෂ්‍යයින්ට පැහැදිලි කරලා දෙනවා ඔබ මුහුණදුන් අපහසුතාවයන්ට ඊළඟට එන නවකයින් පත්කරන්න එපා කියලා. එයද යම් තරමකට නවක වදය පාලනය වීමට හේතුවන්නට ඇති.

නමුත් මේ අතරේ නිහීන වැඩ කරන ඉතාමත්ම සුළු පිරිසක් නොඉන්නවා ම නොවේ. එක් අවස්ථාවකදී නව වදය සම්බන්ධයෙන් ජ්‍යේෂ්ඨ ශිෂ්‍යයෙකුගේ ශිෂ්‍යභාවය පවා අපට තහනම් කරන්නට සිදු වුණා. ඉතින් ඒ ශිෂ්‍යයාත් කල්පනා කරන්න ඕන දෙමව්පියන්ගෙ මුදල් වියදම් කරගෙන ටියුෂන් පන්ති ගණනාවකට ගිහිල්ලා ඉතා අපහසුවෙන් උසස් පෙළ සමත් වෙලා විශ්වවිද්‍යාලයට ඇතුල් වෙලා තමුන්ගේ ශිෂ්‍යභාවය අහෝසි වූ එය කොතරම් තම ජීවිතයට බලපායිද කියල .ඇත්ත වශයෙන්ම මෙතෙන්දි නවක ශිෂ්‍යයා ආරක්ෂා කිරීමට අප බැඳී සිටිනව. ඉතා සුළු ආස්වාදයක් ලබා ගැනීම සඳහා අනවශ්‍ය දේවල් කරන්න ගිහිල්ලා ඇයි මේ දරුවන් තමන්ගෙ ජීවිතය කඩාකප්පල් කරගන්නෙ. අප හැමවිටම උත්සාහ කරන්නේ නවක වදය දෙන්න යන ජ්‍යේෂ්ඨ ශිෂ්‍යයිනුත් නවක වදයට ලක් වන නවක ශිෂ්‍යයනුත් යන දෙකොට්ඨාශයම ආරක්ෂා කර ගැනීමටයි.

සන්නසඃ විශ්වවිද්‍යාලය කියලා කියන්නේ ශිෂ්‍යයකුට ශිෂ්‍යාවකට ලැබෙන මහඟු අවස්ථාවක්. මේ පද්ධතිය තුළ ඉතා වටිනා පහසුකම් ගොන්නක් තියෙනවා. ඉතා වටිනා පොත් සහිත පුස්තකාල පහසුකම්, නොයෙකුත් පර්යේෂණ කිරීම සඳහා විද්‍යාගාර පහසුකම්, තමන්ගේ කලාත්මක හැකියාවන් දියුණු කර ගැනීම සඳහා සුදුසු වටපිටාවක් ඒ වගේම ඒ සඳහා අවශ්‍ය කරන කාලය මේ සියල්ලම විශ්වවිද්‍යාලය තුළ පවතිනවා. නමුත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් මින් ප්‍රයෝජන ගන්නා බවක් පෙනෙන්නට නැහැ. මේය ඉතා අභාග්‍ය සම්පන්න තත්ත්වයක් නේද?

පීඨාධිපතිතුමියඃ විද්‍යා පීඨය තුල නම් ඇත්තටම අපේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් මේ තියෙන සම්පත් වලින් බොහොම ප්‍රයෝජන ගන්නවා. පසුගිය වසරක විශ්වවිද්‍යාලය තුළ පැවැත්වූවා විද්‍යාපීඨය සංවිධානය කළ ප්‍රදර්ශනයක්. මේ ප්‍රදර්ශනය සඳහා ඉතාමත්ම වටිනා නව සොයාගැනීම් රාශියක් අපේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඉදිරිපත් කළා. ප්‍රදර්ශනය නැරඹීමට එන අයට ද එයින් විශාල එල ප්‍රයෝජන ලබා ගැනීමට හැකියාව ලැබුනා.

අප මේ සඳහා සියලුම මාධ්‍ය ආයතන දැනුවත් කළා විශ්වවිද්‍යාලයට පැමිණ සඳහා යම්කිසි ප්‍රචාරක අනුග්‍රහයක් ලබා දෙන්න කියලා. නමුත් කියන්න කනගාටුයි කිසිම මාධ්‍ය ආයතනයක් ඒ සඳහා ඉදිරිපත් වුණේ නෑ. එක් අවස්ථාවක අන්තර් විශ්ව විද්‍යාල සංගමයේ යම් ශිෂ්‍යයන් පිරිසක් පැමිණ මෙම ප්‍රදර්ශනයේ විශාල කලබලයක් ඇති කළා. අපේ ශිෂ්‍යයන්ට පහර දුන්නා . කියන්න කණගාටුයි ඉතාමත්ම සුළු වේලාවකින් සියලුම මාධ්‍ය ආයතන මෙතනට පැමිණ ඒ කලබලය වාර්තා කිරීමට කටයුතු කළා. මම හිතනවා අපේ රටේ ජන මාධ්‍ය මීට වඩා වගකීමකින් කටයුතු කළ යුතුයි කියලා. ප්‍රදර්ශනයේ වැදගත්කම රටට හඳුන්වලා දුන්නා නම් එය නැරඹීමට අවශ්‍ය උදවියට මෙහි පැමිණෙන්නට අවස්ථාව ලැබෙනවා.නමුත් මාධ්‍ය




ඉදිරිපත් වුණේ මේ ශිෂ්‍යයින් දෙගොල්ලක් අතර කලබලයක් වාර්තා කිරීමට.

මං දන්නෑ එයින් සමාජයට විශාල යහපතක් සේවයක් වෙනවද කියලා. අනෙක් කරුණ තමයි විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගෙන් ඉතාමත්ම සුළු පිරිසක් නොයෙකුත් උද්ඝෝෂණ කරමින් මහපාරේ තමන්ගේ වටිනා කාලය විනාශ කර දමනවා. මම කියන්නේ මේ කිසිවකට මාධ්‍ය අනුග්‍රහයක් නොදැක්විය යුතුයි කියලා. මොකද මේවට මාධ්‍ය අනුග්‍රහයක් දැක්වීම කියලා කියන්නේ මේ ශිෂ්‍යාවන් තවත් මෙවන් කටයුතු කිරීමට පෙළඹවීමක්. සමහර අවස්ථාවල මේ වගේ දේවල්වලට ගිහිල්ලා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ මුළු ජීවිතයම විනාශ කරගත් අවස්ථා ඕනෑ තරම් තියෙනවා. මාස කීපයක් යනවිට හැමෝටම ඒවා අමතකයි.

තමන්ගේ ජීවිතය විනාශ කර ගත් ශිෂ්‍යයා මුළු ජීවිත කාලයම දුක් විඳිනවා. ඔහුට පිහිට වෙන්න කිසිවෙක් නෑ. නැවතත් මම මතක් කරන්නේ මාධ්‍ය ආයතන තමන්ගේ වගකීම හරිහැටි හඳුනාගෙන කටයුතු කළොත් ඒකෙන් විශාල සේවයක් වෙයි කියලා.

අපේ විද්‍යා පීඨයේ ශිෂ්‍යයන් අන්තර් විශ්වවිද්‍යාල බල මණ්ඩල වලට සම්බන්ධතාවයක් නෑ. විද්‍යා පීඨය තුළ තියෙනවා විද්‍යාපීඨ ශිෂ්‍ය සංගමය කියල එකක්. ඒක ඔය දේශපාලන කටයුතු සඳහා හෝ කෑට හොල්ලන්න යන වැඩපිළිවෙළවල් වලට පාරේ පෙළපාලි වලට සම්බන්ධ නෑ. බොහෝ විට කෙරෙන්නේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් ගේම උන්නතිය සඳහා විශ්වවිද්‍යාලය තුළ කළ හැකි යම් යම් වැඩ පිළිවෙල වල්. මා ඉහත කී ප්‍රදර්ශනයද ඒ අය සංවිධානය කළ එකක්.මෙයින් සොයාගත් නව නිපැයුම් බොහොමයක් සඳහා දැනට වාණිජ ඉල්ලුමක් ලැබී තිබෙනවා. ඒවට පේටන් බලපත්‍ර ලබාගෙන තිබෙනවා. මේ සියල්ලක් ම මේ සඳහා ඉදිරිපත්වූ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ උන්නතිය සදහා.

මීට අමතරව අපේ තියනවා විෂයානුබද්ධ සමිති සමාගම්. ක්ෂුද්‍ර ජීව විද්‍යා සංගමය. රසායන විද්‍යා සංගමය භෞතික විද්‍යා සංගමය ආදී වශයෙන්. මේ සංගම් වලින් නොයෙකුත් ව්‍යාපෘති සිදු කරනවා. නමුත් මේ කිසිවක් සමාජගත වෙන්නේ නෑ. ජනසමාජයට ඉතාමත්ම වැදගත් වෙන දේවල් සිදුකලත් ඒවා විශ්වවිද්‍යාල මගින් කලා යැයි ප්‍රචාරණයක් ලැබෙන්නේ නෑ. විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙකුගේ අතින් යම් අකටයුත්තක් සිදු වුවහොත් එයට අති විශාල පුළුල් ප්‍රචාරයක් ලැබෙනවා.මෙය විශාල අභාග්‍යයක්. සිදුවිය යුත්තේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙක් කරන වැදගත් කටයුතු සඳහා පුළුල් ප්‍රචාරයක් සමාජගත කිරීම.එයින් ඔවුන් ධෛර්යමත් කිරීමක් ද සිදු වනවා.

අපේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සම්බන්ධ කරගෙන කරන තවත් කටයුත්තක් තියෙනවා. ඒක අපි හඳුන්වන්නේ තිරසාර විසඳුම් මධ්‍යස්ථානය යනුවෙන්. මින් අපි පරිසර විනාශය යම් මට්ටමකින් අඩුකිරීමට දායක වනවා. අපේ තියනවා අපජලය පවිත්‍රකිරීමේ පද්ධතියක්. මේකෙන් අපේ වැසිකිලි සඳහා ගෙවත්ත සහ උද්‍යාන සඳහා අවශ්‍ය ජලය ලබාගන්නවා. අපේ කොම්පෝස්ට් ව්‍යාපෘතියක් තියෙනවා. මීට අමතරව අපි විශ්ව විද්‍යාලය තුළ පොලිතින් භාවිතයෙන් වැළකී සිටිනවා. මේ පුරුදු තුලින් මේ අය සමාජයට ගියත් පොලිතින් භාවිතය අවම කර ගැනීමට යම් උත්සාහයක් දරාවි. මීට අමතරව අපි විමෝචනය කරන කාබන්ඩයොක්සයිඩ් සමතුලිත කිරීම සඳහා කරුවලගස්වැව හෙක්ටයාර 150 ක භූමියක වගා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනවා.

සන්නසඃ ඔබ තුමියට අවසාන වශයෙන් සිසු දරු දැරියන්ට හා සමස්ථ සමාජයට දීමට ඇති පණිවුඩය කුමක්ද? අප පුවත් පත ශ්‍රී ලංකාවේ පුවත් පතක් නොවුවත් ඕස්ට්‍රේලියාවේ වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාව හරහා ලාංකීය සමාජයට යම් බලපෑමක් ඇති කල හැකි බව අප අත් දැකීමෙන් දන්නවා.

පීඨාධිපතිතුමියඃ කැලණිය විශ්ව විද්‍යාලය සඳහා පමණක් රජයෙන් රුපියල් බිලියන තුන හමාරක් වසරකට වියදම් කරනවා.ඒ කියන්නේ ලක්ෂ තිස්පන්දාහක්.විද්‍යා පීඨයේ ආචාර්ය උපාධිය ලත් ආචාර්යවරුන් 85 දෙනෙක් උගන්වනු ලබනවා.ඒ වගේම ඔවුන් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන්ම කැප වෙලා ඉන්න අය. අපේ ආචාර්ය මණ්ඩලයේ සංයුතිය ලෝකයේ දියුණුම විශ්ව විද්‍යාලයක් හා සම කරන්න පුළුවන්. ලංකාවේ කිසිම පෞද්ගලික විශ්ව විද්‍යාලයක මේ තරම් සම්පත් නෑ.

ඉතින් මේ විශ්ව විද්‍යාලයට එන්න ලැබීමත් මේ දරුවන්ට ලැබුණු මහඟු අවස්ථාවක්. මෙවන් අවස්ථාවක් ඔවුන් විදේශයකින් ලබාගැනීමට නම් රුපියල් කෝටියකට වඩා වියදම් කරන්න වෙනවා. මෙහි ඉගෙන ගන්න ලැබෙන්නේ වසර තුනක් හෝ හතරක්.ඉතින් එම කාලය පාරේ කෑට හොල්ලනටත් පෙළපාලි යන්නටත් මිඩංගු කලොත් එය අපේ ආචාර්ය මණ්ඩලයේ කාලයත් විනාශ කර දැමීමක්. මේක ඇතුලේ ඉගෙන ගන්න තරඟයක් නැහැ. හැමෝටම ප්‍රථම පන්ති උපාධියක් උනත් ගන්න පුළුවන්. ඉතාමත්ම අපහසු කඩ ඉම තමයි උසස්පෙළ විභාගය. එම කඩ ඉම පසු කල ඔබ මෙහිදී උපරිම ප්‍රයෝජනය ලබා ගන්න ලෙසටයි මා දරුවන්ගෙන් ඉල්ලා සිටින්නේ.අනෙක් කරුණ තමයි සමහරක් දරුවන් මත් පැන් වලට ඇබ්බැහි වෙලා සිටීම.

මහපොළ ශිෂ්‍යාධාර ලැබෙන ඒවා සමහරක් අය මත් පැන් වෙනුවෙන් වියදම් කරනවා.මහපොළ කියලා ඔබට දෙන්නේ මහජනතාවගේ බදු මුදල්. මේ මුදල් ඔබට දෙන්නේ දෙමාපියන්ට බරක් නොවී ඔබේ අධ්‍යාපන කටයුතු පහසුවෙන් කර ගැනීමටයි.

දියුණු මනසක් ඇති ඔබ ක්‍රියාකළ යුතු ආකාරය සිතට ගන්නවා නම් හොඳයි.අපේ පීඨයෙන් ලබා ගන්නා උපාධිය මුළු ලෝකයම ඉහලින් පිලිගන්නවා. නමුත් ඔවුන්ගේ ඉංග්‍රීසි දැනුමේ අඩුපාඩු කම තදට තියෙනවා. මේ සඳහා අපි උදැසන 7 ට ඉංග්‍රීසි පාඨමාලාවක් ආරම්භ කළා. නමුත් සිසු සිසුවියන්ගේ සහභාගිත්වයක් නොවීම නිසා එය පවත්වාගෙන යාමට නොහැකි වුණා.

සන්නසඃ ඔබතුමියගේ වටිනා කාලය අප වෙනුවෙන් ලබාදීම ගැන බෙහෙවින් ස්තූතිවන්ත වෙනවා. ආයුබෝවන්

සාකච්ඡා කළේ
චිත්‍රාන් මොරකන්දෙ ගමගේ

